# වෙසක් බැති ගී සාහිත රස

**විජේරත්න පතිරාජ**
කථිකාචාර්ය - කොළඹ විශ්ව විද්‍යාලය ශ්‍රීපාලි මණ්ඩපය



වෙසක් බැති ගී සාහිත රස ශ්‍රී ලාංකික සංස්කෘතික උරුම අතරින් කලා ක්ෂේත්‍රයේ සුපුෂ්පිත පුෂ්පය බඳු වූ අපගේ සිංහල බස හා සාහිත්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනය කරමින් එහි කතන්දර කලාවේ මහිමය වෙත අපි ළඟා වී සිටියෙමු. එම දිගහැරුම මදක් පසෙක තබා පසුගිය ලිපිය සූර්ය මංගල්‍ය රස මිහිර ට යොමු වූයේ අපගේ අසිරිමත් උළෙල ලෙස සැළකෙන බක්මහ සැණකෙළිය හා බැඳි ගී සාහිත රස පිළිබඳව විමසා බැලීමට එය උචිතම අවස්ථාව ලෙස සැළකුණු හෙයිනි. පාරිසරික සෞභාග්‍යයත් සමග මුසු වී වසර දහස් ගණනක සිට විවිධ සිරිත් විරිත් හා පෑහී සාමය සහජීවනය අරමුණු කොටගත් එම සමාජ උත්කර්ෂවය අපගේ යහපැවැත්මට කෙතරම් වටිනේදැයි අවුරුදු සිරිත් මෙරට සිට අනුගමන කළ අයටද නොදැනුනා නොවේ. අප සාකච්ඡා කළ ගීත සාහිත්‍යයෙන්ද මතු කළේ එම පූජා කර්මයේ උත්තරීතර ගුණයයි.

කැවුම් සුවඳ පහ වී යන්ට පෙර ශ්‍රී ලාංකික සිංහල බෞද්ධ ජනතාව අතර හමා යන්නේ අමාදම් සිසිලසයි. බුදු ගුණ සුවඳයි. වෙසක් මාසය බුදු මගුල ලෙස ඉතිහාසය පුරාවට සැළකෙන්නේ බුද්ධෝත්පත්තිය බුදුවීම හා පරිනිර්වාණය යන තෙමගුල සිදු වූ අසිරිමත් මොහොත අනුස්මරණය කිරීම නිමිති කරගෙන ය. විශ්වය පුරා පැතිරී ගිය එකම සම්බුද්ධ රාජ්‍යය වසර 2560 කටත් වැඩි ඈත ඉතිහාසයේ සිට වැඩුන දාන-ශීල-භාවණාදියෙන් සුපෝෂිතව බෞද්ධ උරුමය අනුස්මරණය කෙරෙන අද්විතීය උළෙල එයම ය. සාහිත්‍යාවලියේ අනුරපුර යුගයේ සිට රචිත අමාවතුර බුත්සරණ පූජාවලී දම්පියා අටුවාව ජාතකකතාදියෙන් ප්‍රකාශිත අනන්ත බුදු ගුණ දම් ගුණ සගගුණ කෙතරම් ද? එහෙයින් මෙම ලිපියෙන් ත්‍රිවිධ රත්නයේ ගුණ අපගේ ගීත සාහිත්‍යයට යොමු වී ඇති ආකාරය විමසා බැලීම කාලීන වැදගත් අවශ්‍යතාවක් යයි හැඟී යයි.

ශ්‍රී ලාංකික බොදු බැති ගී සාහිත්‍යය ඓතිහාසික වූවක් නොවේ. බොදු සාහිත්‍යයේ ආරම්භක රචනා විලාසය ලද්‍ය ශෛලියට නැඹුරු වූවකි. පසුව පෙදෙන් බුදු සිරිත සම්මුතිය අනුව කාව්‍යාකාරයට නැඹුරු වූවත් සංගීතවත් ගීත කලාවක ව්‍යාප්තියක් නොපෙනේ. 18 -19 සියවස් වලදී ව්‍යාප්ත වූ නාඩගම් නූර්ති කලාවන් සමග වර්ධනය වූ සංගීතය සමග ගීත කලාවක් සම්ප්‍රාප්ත වූ බවට සාක්ෂි පවතී. නූතන ගීත සාහිත්‍යයේ ව්‍යාප්තිය එකී නාට්‍ය කලාවන් සමග බිහිවෙද්දී නාට්‍ය කලාවෙන් බැහැරව ගීත ගායන කලාවක්ද ජනප්‍රියත්වයට පත්විනි. එහි පුළුල් ව්‍යාප්තියට 1940 පසු පුළුල් මාධ්‍යයක් බවට පත් වූ ග්‍රැමපෝන් ගී තැටි කලාව සන්ධිස්ථානයක් විය. වෙසග පිළිබඳ සෘජුව රචිත ඒ එම් යූ රාජ් ගායනා කළ තිලොවග රාජා භව සැරි සරලා ගීතයත් විචියන් බොරලැස්සගේ ආලෝකය මේ යයි පවසන දිනයයි යන ගීත ජනප්‍රිය ආරම්භක ගීත ලෙස සැළකේ. මීට අමතරව ඒ ජේ කරීම් මොහොඩි මොහිදීන් ඉබ්‍රහිම් වැනි මුස්ලිම් ගායකයන් රැසක් බෞද්ධ ගීත ගයා තිබීම සුවිශේෂ කරුණකි.

මීට අමතරව රේඛාව (1956) චිත්‍රපටයේ එන ප්‍රකට වෙසක් ගීතය වන වෙසක් කැකුළු අතු අග හිඳ නටන විලාසේ ගරු මර්සලින් ජයකොඩි පියතුමන්ගේ බෞද්ධ රචනයක් වීමද සඳහන් කළ යුතු සුවිශේෂ කරුණකි. මෙරට පොදු බොදු ගීතයක් ලෙස වැඩිම ජනප්‍රියත්වය ලබන්නේ මොහිදීන් බෙග් ගයන බුද්ධං සරණං ගච්ඡාමි නම් ගේය පද නිර්මාණයයි. එය කරුණාරත්න අබේසේකර යන් විසින් අංගුලිමාල චිත්‍රපටයට කළ රචනාවක් වූ අතර එතරම්ම ජනප්‍රිය දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා ගීතය ජෝන් ද සිල්වා ශූරීන්ගේ සිරිසඟබෝ නූර්තියට අයත්වීමද සුවිශේෂ කරුණකි. බුදුන්ගේ අමා ධර්මේ - සකළ සතම බුදු බැතියෙන් - මිනිසාමයි ලොව දෙවියන් වන්නේ - සිරිපාදේ වැනි වැඩිම බොදු ගී රාශියක් ගායනා කර ඇත්තේ මොහිදීන් බෙග් බව ඔහුට ගෞරවයක් ලෙස මෙහි ලා සඳහන් කළ යුතුය.

තම දායකත්වය ලබා දී අමරණීයත්වයට පත් සිංහල බොදු ගී රැසක් බිහිකළ ගායක ගායිකාවන් හා ගේය පද රචකයන් ගණනාවක් ඇතති නූතන විශිෂ්ට ගනයේ සරළ බොදු බැති ගී කීපයක් පිළිබඳව මෙහිදී විශේෂ අවධානයක් යොමු කිරීම අවශ්‍ය වේ. ආචාර්ය ඩබ් ඩී අමරදේව ශූරීන් මධුර ස්වරයෙන් මුදා හළ ප්‍රබුද්ධ ගේය පද කීපයක් වෙසක් සමය පුරා ශ්‍රී ලංකාව පුරා පැතිරී යන ආකාරය සුලභ දසුනකි.

## පාරමිතා බල පූරිත පූජිත

කලාශ‍්‍රී අමරදේව - නන්දා මාලිනී

පාරමිතා බල පූරිත පූජිත බුද්ධ දිවාකරයානෝ
වෙසක් පොහෝ දින දිනූ සේක ලොව
බුද්ධ දිවාකරයානෝ

සැනසෙමු පුද දී මුනි සිරිපාදේ
පිහිනමු පිහිනමු බුදුගුණ මුහුදේ

සනසා මුලු ලොව නිවන් ලබා දී
පුණ්‍ය මහෝදධි ශාන්ති සමාධී
සරණාමර ගුරු ලෝක ශිවංකර
බුද්ධ දිවාකරයාණෝ

මාර පරාජය කළ මුණිඳුන්ගේ
කරුණා සීතල මෙත් ධාරා
ගලා බසී තුන් ලෝ තලයේ දුක්
ගිමන් නිවා අම සෙත සාදා

බුදුරුස් කැටි වී නැගි ආලෝකේ
පිසයයි දුකඳුර මුළු තුන්ලෝකේ

බුදු සිරිතේ මූලික අවස්ථා බුද්ධාලම්භන බැතියෙන් ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ ශ‍්‍රීන් අතින් රචනා වී අමරදේවයන්ගේ සුගායනයෙන් ප්‍රභාෂ්වරයට පත් වූ නිර්මාණයකි.

## අඬවන් වූ දෙනෙතින් ගලනා

ඩබ්ලිව් ඒ අබේසිංහයන්ගේ සුභාවිත ගේය පද වැලකින් යුත් මෙම ගීතය අනුරපුර මහමෙව්නා උයනේ වැඩ වසන සමාධි බුදු පිළිම වහන්සේ ගේ සජීවී බුදු ගුණය ප්‍රතිමූර්ති කරන්නේ ඊටම සරිලන අමරදේවයන්ගේ සුලලිත ගායනයෙනි.

අඬවන්වූ දෙනෙතින් ගලනා
මෙත් මුදිතා කරුණා ධාරා//
තෙමා තෙමා
හද ගලා ගලා යන
ලොව්තුරු ගුණ මහිමේ
මහමෙව්නා උයනේ සමාධි බුදු පිළිමේ...

පිරිතිරි යන මහ වතුරක්සේ
ගලා හැලෙන සිහිලැල් ගඟුලක් සේ
ගිමන් නිවාලන මේ භව කතරේ
නිවන් සදාලන බුදු ගුණ මහිමේ
මහමෙව්නා උයනේ
සමාධි බුදු පිළිමේ...

ගීතය 3 - ඇසේ මතුවෙන කඳුලු බිඳු ගෙන
විශාරද ඩබ් ඩී අමරදේව




මහගම සේකරයන්ගේ සුගම සුගැඹුරු ගේය පද බුදු බඳෙහි නිර්මල ගැඹුර විමසා විනිවිද දැකීමට යොමු වූ ප්‍රයත්නයක් මෙහිදී පසක්වේ. සසර ගමනක අසරණ වූවකුට බුදුන් දැක ලබන සැනසීමෙන් තමන් ගත කළ ක්ෂුද්‍ර ආත්මය පසක් කරගත හැකිවීම අමරදේවයන්ගේ ස්වර රචකයාගේ සුගම පද වැල් ධ්වනිත කරවන්නේ දහම් පිපාසය නිවාලන්නට පිළිසරණ වන්නට බුදු හිමියන් වෙත ආයාචනය කරන පින්මද දුහුනකුගේ යාදින්නාවකි වික්ටර් රත්නායක ගේ භක්ති පූර්ණ මධුර ස්වරය ඊට කෙතරම් ගැලපී ඇත්දැයි ගීතය විඳීමෙන් පසක් වනු ඇත

### ගීතය 5 - අමා දහර දිය ගලා ගලා

විශාරද වික්ටර් රත්නායක

අමා දහර දිය ගලා ගලා
තුරු ලතා තුලින් මල් පියලි සලා
ජය හඬින් ලොවට සිහ නද පතුරා
ලෝ සත අතරින් ජනිත උනා...

සැපෙහි කිමිදී දුකෙහි ගැලීලා
මැදුම් පිළිවෙතින් අමා සුව ලබා...
දහම් සුවඳ මල් දසතම පතුරා
සියලු කෙලෙස් මැඩ බුදු වූවා...

අමා දහර...

ජීවිතයේ ඇති නොනිමි අතිර බව
ලොවට පැතුරු කරුණාවේ අම ගුණ...
සියලු සතුන් වෙත දහම් රස පෙවූ
කරුණා බර නෙත් නිවී ගියා...



සංකලනයෙන් ධ්වනිත වෙයි.

### ගීතය 4 - නිවන් දුටු හිමි

විශාරද වික්ටර් රත්නායක
ප්‍රේමකීර්තිද අල්විස් නම් ප්‍රකට ගේයපද

නිවන් දුටු හිමි රුවන් පිළිරුව
පමණි මට අද ශේෂ වූයේ
හිමි දෙසූ බණ අසා ඇතිමුදු
ඇසූයේ හිමිගේ හඬින් නොව
අනේපිඬු සිටු පුතුට මෙන්
අනේ හිමියනි මටද දැන්
දෙසා වදාල මැනවි බුදු බණ
මහා කරුණාවෙන්... මහා කරුණාවෙන්

ගලක් වී නම් මමත් ඉවසමි
යකුළු පහරද කැපී වෙන්වෙන
ඔබේ පිළිරුව නිම කරන්නට
කලාකරුවකු අතින් ලැබෙනා
එයින් හිමිහුරු කලාවූ
ශාන්තිය මට ලැබේවා
මහා කරුණාවෙන්... මහා කරුණාවෙන්

මලක් වන්නට නොහැක හිමියනි
මිනිස් බව ලැබ සිටින මා හට
මලක් අද ඔබ දෙපා පාමුල
විඳින සිහිලස නොමැත මා හට
මලක් වූදා මගේ ජීවය
ඔබේ පාමුල පර වුනාවේ

නිවන් දුටු හිමි.......

පුණ්‍යසිරි මහවත්ත තම ගේය පද වලින් වෙසක් අසිරියේ ප්‍රධාන ත්‍රිවිධ මංගල්‍ය වන බුද්ධෝත්පාදය - බුද්ධත්වය - හා පරිනිර්වාණය පරිසරයට හා සියලු සතුනට දැනුණ අපූර්වත්වය වික්ටර් රත්නායකගේ මධුර ස්වර සංකලනයෙන් සප්‍රාණි වූ විලාසයක් මේ ගීය හා බැඳී පවතී

### ගීතය 6 - දෙව්රම් වෙහෙරේ

විශාරද වික්ටර් රත්නායක




33 වන පිටට